# නාට්‍ය හා රංග කලාව

## විෂය නිර්දේශය

### 10 වන ශ්‍රේණිය

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකා

2007

## 10 වන ශ්‍රේණිය

## හැඳින්වීම

ජ්‍යෙෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල ආරම්භක අවස්ථාව වනුයේ 10 වැනි ශ්‍රේණිය යි. නව යොවුන් වියට අවතීර්ණ ව සිටින මෙම සිසුන් ගේ සමාජ දෘෂ්ටිය සහ වින්දන ප්‍රවණතා අනාගතයට දැඩි ලෙස බලපායි. සෞන්දර්ය විෂයයන් අතර දරුවා ගේ මනස හා සිරුර කේන්ද්‍ර කොටගත් ක්‍රියාකාරකම් පාදක විෂයයක් වූ නාට්‍ය හා රංග කලාව සිසුන් ගේ පෞරුෂ සංවර්ධනය උදෙසා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් 1992 දී කරන ලද නිර්දේශයට අනුව 10 වන හා 11 වන ශ්‍රේණි සඳහා නාට්‍ය හා රංග කලාව විෂයයක් ලෙස ඇතුළත් කිරීමෙන් වත්මන් සිසුවා ඵලදායි ප්‍රතිඵල නෙළාගනිමින් සිටියි. එම වර්ෂයේ හඳුන්වාදුන් පොදු නිපුණතා සාක්ෂාත් කරගැනීමේ අරමුණ තව දුරටත් අර්ථවත් කරමින් 2006 වර්ෂයේ දී නිපුණතා පදනම් කරගත් නව විෂය නිර්දේශයක් ලෙස මෙය ඉදිරිපත් කරනු ලැබ ඇත. විෂය කරුණු ලබාදීමට වඩා ප්‍රායෝගිකත්වයට නැඹුරු වූ නිශ්චිත නිපුණතා ළඟා කරගත හැකි පරිදි ක්‍රියාකාරකම් පාදක කරගත් විෂයමාලාවක් ලෙස මෙය හැඳින්විය හැකි ය.

10 වන ශ්‍රේණියේ ඉගෙන ගන්නා යොවුන් සිසුවා තුළ රසවින්දනය හා විචාරශීලී බව මතු කරගැනීම සඳහා නාට්‍ය පෙළ හැදෑරීම හා විවිධ ක්‍රියාකාරකම් ප්‍රබල ප්‍රවේශයක් වනු ඇත. නාට්‍ය පෙළ හැදෑරීමේ දී මෙම සිසුහු "ගැටුම" යන සංකල්පය හදාරති. එහි දී නාට්‍යයන්හි ඇතුළත් ගැටුමට විකල්ප විසැඳුම් ඔවුහු අත්විඳිති. ඒ අනුව වත්මන් සමාජය තුළ පවතින විවිධ ප්‍රශ්න හා ගැටලුවලට වඩා යථාර්ථවාදී ව හා ශුභවාදී ව විසැඳුම් ලබාගැනීමට ඔවුන් ගේ පූර්ව අත්දැකීම් ඵලදායි වනු ඇත.

මේ සියල්ල ළමයා ගේ සුසමාහිත පෞරුෂ වර්ධනයට හේතු වනවා පමණක් නො ව විසිවන සියවසට ගැළපෙන දරුවකු බිහිවීම ද ඉන් සිදු වේ. නාට්‍ය හා රංග කලාව ඉගැන්වීමෙහි යෙදී සිටින ගුරුභවතුන් මෙම විෂය පැහැදිළි දැක්මක් ඇති ව අර්ථාන්විත ව හා සජීවි ලෙස පන්තිකාමරය තුළ සංවිධානය කිරීමෙන් වඩාත් සාර්ථක ප්‍රතිඵල ලබාගත හැකි වේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## විෂයයට අදාළ නිපුණතා

01. නාට්‍ය හා රංග කලාවට පාදක වූ සිද්ධාන්ත පැහැදිලි කරයි.

02. පරිසරය ආශ්‍රිත අත්දැකීම්, අමුද්‍රව්‍ය හා ස්වකීය පරිකල්පනය සමග මනා ලෙස සංකලනය කරමින් නිර්මාණාත්මක හැකියාව ප්‍රදර්ශනය කරයි.

03. නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.

04. නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ දේශිය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

05. නාට්‍යමය සංසිද්ධින් සෞන්දර්යාත්මක ව විඳගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගතවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම

- නාට්‍ය හා රංග කලාව සමග බැඳි ප්‍රධාන සිද්ධාන්ත පිළිබඳ පැහැදිළි කරයි.
- නාට්‍යය යනු කුමක්දැයි නිර්වචනය කරයි.
- නාට්‍යයක් අනෙකුත් කලාවන් ගෙන් වෙනස් වන්නේ කෙසේ දැ යි පැහැදිළි කරයි.
- නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය යන ප්‍රභේද තුනෙහි වෙනස පැහැදිළි කරයි.
- වේදිකා නාට්‍යයෙහි විශේෂතා පිළිබඳ විමසයි.
- වාචික , ආංගික, සාත්ත්වික හා ආහාර්ය යන අභිනයන් නිදසුන් සහිත ව පෙන්වා දෙයි.
- අනුකරණය යන්න අර්ථ කථනය කරයි.
- ලෝකධර්මී හා නාට්‍යධර්මී යන නාට්‍ය ශෛලීන් දෙකෙහි ප්‍රධාන ලක්ෂණ හා වෙනස්කම් පැහැදිළි කරයි.
- අභ්‍යන්තර හා බාහිර සමාරෝපය යන්නට අර්ථ දක්වයි.
- නාට්‍යයක ගැටුම යන්න කුමක් දැ යි නිර්වචනය කරයි.
- ලෝකධර්මී හා නාට්‍ය ධර්මී යන ශෛලීන් දෙකෙහි ඇති වෙනස්කම් නාට්‍ය තුළ භාවිතා වන්නේ කෙසේ දැ යි පැහැදිළි කරයි.
- ස්වාභාවික චලන, නිර්මිත චලන, හා තාලානුකූල චලනවල ප්‍රායෝගික ව යෙදෙයි.
- ශාරීරික හා මානසික ඒකාග්‍රතාව සඳහා විවිධ තාල හා රිද්මයන්ට අනුකූල ලෙස අභ්‍යාසවල යෙදෙයි. (එම චලනවලට භාවාත්මක හා වාචික ප්‍රකාශන ඇතුළත් කිරීම.)
- ක්ෂණික තීරණ ගැනීම, ක්ෂණික ව ක්‍රියාත්මක වීම, අවධානය ලබාගැනීම වැනි ගුණාංග පදනම් කරගත් රංග ක්‍රීඩාවන්හි යෙදෙයි.
- චරිතයක්, සිදුවීමක්, අවස්ථාවක් හෝ කිසියම් භාණ්ඩයක් තේමා කරගත් කේවල හා සාමූහික නිරූපණයන්හි යෙදෙයි.
- පවරනු ලබන ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි.
- කතා හෝ අත්දැකීම් ඇසුරින් නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි.
- කතාන්දරයක් හා නාට්‍යයක් අතර වෙනස දක්වයි.
- නාට්‍යයෙහි කතාව රංගයක් බවට පත් කිරීමේ දී සලැකිය යුතු කරුණු භාවිතා කරයි.
- මුල, මැද, අග සහිත කතා වස්තුවකින් යුත් නාට්‍ය පෙළක් රචනා කර උචිත රංග ශිල්ප භාවිත කරමින් එකී පෙළ රංගයක් බවට පත් කරයි.
- ශ්වසන, සංවේදන, කටහඬ, ශිථිලීකරණ (සිරුර සැහැල්ලු කිරීමේ) හා චිත්ත ඒකාග්‍රතාව ඇති කරගැනීමේ අභ්‍යාසයන්හි යෙදෙයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

- නිර්දිෂ්ට නාට්‍ය පෙළ කියවා නාට්‍යෝචිත පරිදි සංවාද භාවිත කරයි.
- නිර්දිෂ්ට පෙළ ඇසුරින් චරිත නිරූපණයේ යෙදෙයි.

- විවිධ භූමිකාවන්ට ගැළපෙන අංග රචනය කිරීම හා රංග භාණ්ඩ නිර්මාණය කරයි.
- දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍ය අංකුරමය අවස්ථා අධ්‍යයනය කර එහි ඇති ප්‍රාසංගික ලක්ෂණ හඳුනාගනී.
- දේශීය ශාන්තිකර්මයන්හි එන ප්‍රාසංගික ලක්ෂණ විමසයි.
- දේශීය ජන නාට්‍ය සම්ප්‍රදායේ එන ප්‍රාසංගික ලක්ෂණ විමසයි.
- සාමූහික රසවින්දනය, අදහස් ප්‍රකාශනය, අන්‍ය අදහස් පිළිගැනීම ආදිය සඳහා නිර්දිෂ්ට නාට්‍ය පෙළ හා නරඹන ලද නාට්‍ය භාවිතා කරයි.
- සංවාද, චරිත, ගැටුම, අවස්ථා ගොඩනැගීම කතා වස්තුව, රංග විධාන හා අපූර්වත්වය පිළිබඳ අවධානය යොමු කරමින් නාට්‍ය රස විඳියි.
- රංග ශෛලිය, චරිත නිරූපණය, (සතර අභිනය භාවිතය) රංගනය, අවස්ථා නිරූපණය හා රංග ශිල්ප භාවිත කරයි.
- නාට්‍ය නිර්මාණයේ සමස්ත සාර්ථකත්වය පිළිබඳ විචාරයේ යෙදෙයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# ඉගැනුම් ඉගැන්වීම් ක්‍රමවේද

10 වන ශ්‍රේණිය නාට්‍ය හා රංග කලාව විෂය සඳහා පංති කාමර මට්ටමින් ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීමේ දී මෙම සිසුන් ගේ සංවර්ධන අවධිය පිළිබඳ ව දැඩි අවධානයක් යොමු කළ යුතු වේ. ප්‍රධාන ක්ෂේත්‍ර පහක් ඔස්සේ විහිදී ඇති විෂය නිර්දේශය මගින් අපේක්ෂිත නිපුණතා ළඟා කර ගැනීමට ගුරු හා සිසු ක්‍රියාකාරකම් සංවිධානය කරගත යුතු වේ.

නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
ප්‍රායෝගික ක්‍රියාකාරකම්
සංස්කෘතික පසුබිම
සිද්ධාන්ත
රසාස්වාදය හා විචාරය

නූතන සමාජ අවශ්‍යතාවන්ට අනුරූප ව මෙම විෂයයේ ගැබ් ව ඇති ප්‍රායෝගික අත්දැකීම් කේවල හා සමූහ වශයෙන් ලබාගත හැකි වන අයුරින් මීට අදාළ ඉගැනුම් -ඉගැන්වීම් ක්‍රමෝපායන් පංති කාමරය හා අදාළ ස්ථානවලදී සංවිධානය කරගැනීම වැදගත් වේ.

1. අවට සමාජය සම්බන්ධ කොටගත් නිර්මාණාත්මක ක්‍රියාකාරකම් .
2. සාමූහික ක්‍රියාකාරකම්
3. රංග ක්‍රීඩා
4. ප්‍රායෝගික ක්‍රියාකාරකම්
5. ක්ෂේත්‍ර චාරිකා
6. ශ්‍රව්‍ය - දෘශ්‍ය ආධාරක
7. පන්ති කාමර රංග ක්‍රියාකාරකම්
8. නාට්‍ය නැරඹීම හා විචාරය කිරීම.
9. නාට්‍ය දර්ශන පාසල් මට්ටමින් සංවිධානය කිරීම.
10. සම්පත් පුද්ගලයින් සමඟ සාකච්ඡා කිරීමේ ක්‍රමය
11. සම්මන්ත්‍රණ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 10 වසර - ගුණාත්මක යෙදැවුම්

- විවිධ චරිතයන්හි බාහිර පෙනුම (ඇඳුම්, පැළඳුම්) හඳුනාගැනීමට අවශ්‍ය පින්තූර හෝ ඡායාරූප.
- තාල වාදනය සඳහා දවුලක් හෝ බෙරයක්, තාලම්පට, දඬු බෙරයක්.
- මනමේ, සිංහබාහු නාට්‍යයන්හි ශ්‍රව්‍ය දෘෂ්‍ය පට හා නාට්‍ය පෙළ
- කැළණි පාලම නාට්‍යයේ ශ්‍රව්‍ය දෘෂ්‍ය පට හා නාට්‍ය පෙළ
- මනමේ, සිංහබාහු, කැළණි පාලම නාට්‍යයන්හි ඡායාරූප.
- සංගීතය පමණක් ඇතුළත් ශ්‍රව්‍ය පට (මන්දගාමී)
  සංගීතය පමණක් ඇතුළත් ශ්‍රව්‍ය පට (වේගවත්)
- වී.සී.ඩී. තැටි ධාවන යන්ත්‍රයක් .
- කැසට් රෙකෝඩරයක්.
- රූපවාහිනී යන්ත්‍රයක්.
- විවිධ කතන්දර පොත්.
- මුද්‍රිත ළමා නාට්‍ය පොත්.
- අංග රචනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා උපකරණ.
- නරිබෑණා නාට්‍ය පෙළ
- දයානන්ද ගුණවර්ධන මහතාගේ වෙනත් නාට්‍ය (මධුර ජවනිකා, ආනන්ද ජවනිකා, කාමරේ පොරේ)
- දේශීය ශාන්තිකර්ම හා ජන නාට්‍ය අඩංගු ග්‍රන්ථ සහ V.C.D, D.V.D,V.H.S.
- දේශීය ශාන්තිකර්ම හා ජන නාට්‍යයන්හි ඡායාරූප.
- වේදිකා නාට්‍ය, ළමා නාට්‍යයන්හි V.C.D/ D.V.D සහ V.H.S

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

නාට්‍ය හා රංග කලාව පාසල් මට්ටමින් 2007 වර්ෂය වන විට 6 වැනි ශ්‍රේණියට ද ඇතුළත් කිරීමට කටයුතු යොදා ඇත. ඒ නිසා 10 වන ශ්‍රේණිය වන විට වඩා පුළුල් ලෙස සිසුවා තුළ නිපුණතා ගොඩනැංවීමක් සිදු වනු ඇත. එබැවින් පාසලේ දී සිසුන් තුළ ගොඩනැගි තිබෙන විෂයට අදාළ දැනුම, ආකල්ප හා කුශලතා වඩා ඔප් නංවාගත හැකි ලෙසට විවිධ මානව හා භෞතික සම්පත් සම්පාදනය කරදීම වැදගත් වේ.

01. නාට්‍ය හා රංග කලාව පිළිබඳ ව ලියැවී ඇති දෙස් විදෙස් ග්‍රන්ථ ඇතුළත් පුස්තකාලය අංශයක් ඇති කිරීම හා එය පරිහරණය කිරීමට සිසුන් හුරු කිරීම.
02. සිසුන් ගේ නිර්මාණ එළිදැක්වීම සඳහා ඇති රංග පීඨය අර්ථවත් ලෙස භාවිතයට ගැනීම.
03. නාට්‍ය ක්‍රියාකාරකම් කාමරය ක්‍රියාකාරී ව පවත්වාගෙන යාම.
04. ජාතික මට්ටමේ නාට්‍ය නැරඹීමට සිසුන් යොමු කිරීම.
05. පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක විවිධ නාට්‍ය තරඟ සඳහා සිසුන් යොමු කිරීම.
06. නාට්‍ය හා රංග කලාව විෂය සම්බන්ධ විවාද හා ප්‍රදර්ශන පැවැත්වීම.
07. නාට්‍ය පිටපත් හා පැවරුම් කාර්යයක් සඳහා උනන්දු කරවීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## තක්සේරුකරණය හා ඇගැයීම

01. 10 වන ශ්‍රේණියේ දී නාට්‍ය හා රංග කලාව විෂය ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යන අවස්ථාව තුළ දී ම ඇගයීමට ලක් කිරීම අපේක්ෂිත ය. දැනුම, ආකල්ප හා කුශලතා පදනම් කොටගෙන ගොඩනගනු ලබන සිසු නිපුණතා ඇගැයීමට යොමු කිරීමේ ද පරිකල්පන ශක්තිය කොතෙක් දුරට ගොඩ නඟාගෙන ඇත්දැයි යන්න සොයා බැලීම වැදගත් වේ.

02. නාට්‍ය හා රංග කලාව සම්බන්ධ විශේෂ හැකියා ඇති සිසුන් ගේ නිපුණතා හඳුනාගන්නා ආකාරයට ඊට උචිත නිර්ණායක ඔස්සේ තක්සේරුවට හා ඇගැයීමට සිසුන් යොමු කිරීම කළ යුතු ව ඇත.

03. 10 වැනි ශ්‍රේණියේ සිසුන් ගේ වර්ධන මට්ටම්වලට උචිත වන ඇගැයීම් ප්‍රභේද තෝරා බේරාගෙන විෂය නිපුණතා මතු කර ගැනීමට හැකි වන ලෙසට පාසල් පාදක ඇගයීම් ක්‍රියාත්මක කිරීම යෝග්‍ය වේ.

04. වසර අවසානයේ දී පැවැත්වෙන වාර්ෂික පරීක්ෂණයේ දී ලිඛිත හා ප්‍රායෝගික අංශ දෙක ම විෂයයේ නව නැඹුරුවට උචිත ආකාරයෙන් නව ආකෘතියක් ඔස්සේ තක්සේරු කරනු ලැබේ.

05. පාසල් පාදක ඇගයීම් ක්‍රියාවලියේ දී ලබාගත් ලකුණු ජාතික මට්ටමේ ඇගැයීම් ක්‍රියාවලියට ඇතුළත් කරනු ලැබේ.

සිසුන්ට ඉදිරිපත් කරනු ලබන සෑම ක්‍රියාකාරකමක දී ම තක්සේරුකරණය හා ඇගැයීම සිදු කිරීමට අවස්ථා තිබේ. සිසුන් කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙන අවස්ථාව තක්සේරුකරණයටත් කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කෙරෙන හා අදහස් විස්තාරණය කෙරෙන අවස්ථා ඇගයීමටත් යොදාගත හැකි වේ.

සිසුන් අදාළ කාර්යයේ යෙදෙන අවස්ථාවල දී ඔවුන් සමීප ව නිරීක්ෂණය කරමින් ඔවුන් ගේ හැකියා, නොහැකියා, ශක්තීන් හා දුර්වලතා හඳුනාගනිමින් පන්තියේ සෑම ශිෂ්‍යයකු ම අවම ප්‍රවණතා මට්ටමට ගෙන ඒමට ගුරුවරයා ක්‍රියා කළ යුතු වේ. මේ ක්‍රියාවලිය තක්සේරුකරණය නම් වේ. එසේ ම සිසුන් ස්වකීය අනාවරණ ඉදිරිපත් කරන හා අදහස් විස්තාරණය කරන අවස්ථාවල දී ඔවුන් ළඟාකරගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කරමින් හා ප්‍රතිඵල සන්නිවේදනය කරමින් ඇගැයීම් ක්‍රියාත්මක කළ හැකි වේ.

සිසු කණ්ඩායම් සමස්ත පන්තිය වෙත සාමූහික ව ඉදිරිපත් කරන අදහස්, ඇගැයීම සඳහා යොදාගත හැකි පළමු අංශය බව මේ අනුව පැහැදිලි වේ. එම අදහස් නිවැරැදි කිරීමට, වැඩි දියුණු කිරීමට හා විස්තාරණය කිරීමට කරණු ලබන ප්‍රයත්න ඇගයීම සඳහා පාදක වන දෙවන අංශය වේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

සෑම ක්‍රියාකාරකමක් අවසානයේ දී ම හඳුන්වාදෙනු ලබන නිර්ණායක සහ තක්සේරුකරණයට හා ඇගයීමට යොදාගත හැකි වේ. මින් පළමු නිර්ණායක තුන දැනුම, ආකල්ප හා කුශලතා ඇගැයීමට වෙන් වී ඇති අතර, අනෙකුත් නිර්ණායක දෙක යහපත් ජීවන පුරුදු සිසුන් තුළ වර්ධනය කිරීමේ අරමුණින් හඳුන්වා දී තිබේ.

වර්ෂය තුළ නිම කළ යුතු පාසල් පාදක ඇගයීම් වාර ගණන හයකි. සිසුන් ඉගෙනුමෙහි යෙදෙන අතරතුර කැරෙන ඇගයීමට අමතර ව තෝරාගත් ලක්ෂණයන් හයක දී මෙම ඇගැයීම් ක්‍රියාත්මක කිරීම වඩා ඵලදායී වේ. ඒ ඒ ලක්ෂ්‍යය සඳහා ගැළපෙන ඇගැයීම් උපකරණ කල් තබා සකස් කර ගෙන තිබීම මෙහි දී වැදැගත් වේ.

ප්‍රවීණතාව ලබාගැනීම මට්ටම් කිහිපයක් ඔස්සේ සිදු වන බැවින් විෂයයක ප්‍රවීණතාව තහවුරු කිරීමට අවම වශයෙන් ලකුණු 60 ක් ඉක්මවා ලකුණු ලබාගැනීම අවශ්‍ය වේ. ලකුණු 60-80 දක්වා සීමාව ආසන්න ප්‍රවීණතා මට්ටම ලෙසත් ලකුණු 60 ට අඩු සීමාව ප්‍රවීණතාව නැති මට්ටම ලෙසත් සලකනු ලැබේ. මේ කරුණු පහත සඳහන් ආකාරයෙන් වගු ගත කළ හැකි වේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| ඒ අනුව ලකුණු | 0 | - | 60 | - | ප්‍රවීණතාව නැත |
| ලකුණු | 61 | - | 80 | - | ආසන්න ප්‍රවීණතාව |
| ලකුණු | 81 | - | 100 | - | ප්‍රවීණතාව |

සේ සැලකිය යුතු ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 10 ශ්‍රේණිය - නාට්‍ය හා රංග කලාව විෂය නිර්දේශය

| නිපුණතාව හා නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|
| 01. නාට්‍ය හා රංග කලාවට පාදක සිද්ධාන්ත පැහැදිලි කරයි.<br>නාට්‍ය හා රංග කලාව සමග බැඳි ප්‍රධාන සිද්ධාන්ත පිළිබඳ පැහැදිලි කරයි. | (1) සිද්ධාන්ත<br>♦ නාට්‍ය හා රංග කලාව සමඟ බැඳි ප්‍රධාන සිද්ධාන්ත පිළිබඳ පැහැදිලි කිරීම. | 20 |
| | 1.1 නාට්‍ය | |
| • නාට්‍ය යනු කුමක්දැයි නිර්වචනය කරයි. | 1.1.1 නාට්‍ය යනු කුමක්දැයි නිර්වචනය කිරීම. | |
| • නාට්‍යයක් අනෙකුත් කලාවන්ගෙන් වෙනස් වන්නේ කෙසේ දැ යි පැහැදිලි කරයි. | 1.1.2 නාට්‍යයක් අනෙකුත් කලාවන් ගෙන් වෙනස් වන්නේ කෙසේ දැ යි සාකච්ඡා කිරීම. | |
| • නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය යන ප්‍රභේද තුනෙහි වෙනස පැහැදිලි කරයි. | 1.1.3 නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය යන ප්‍රභේද තුනෙහි වෙනස පැහැදිලි කිරීම. | |
| • වේදිකා නාට්‍යයෙහි විශේෂතා පිළිබඳ විමසා බලයි. | 1.1.4 වේදිකා නාට්‍යයෙහි විශේෂතා පිළිබඳ සාකච්ඡා කිරීම. | |
| | 1.2 අභිනය | |
| • වාචික, ආංගික, සාත්ත්වික හා ආහාර්ය යන අභිනයන් නිදසුන් සහිත ව පෙන්වා දෙයි. | 1.2.1 වාචික, ආංගික, සාත්ත්වික හා ආහාර්ය යන අභිනයන් නිදසුන් සහිත ව විග්‍රහ කිරීම. | |
| | 1.3 අනුකරණය | |
| • අනුකරණය යන්න අර්ථ කථනය කරයි. | 1.3.1 අනුකරණය යන්න අර්ථ කථනය කිරීම. | |
| | 1.4 නාට්‍ය ශෛලි | |
| • ලෝකධර්මී හා නාට්‍යධර්මී යන නාට්‍ය ශෛලීන් දෙකෙහි ප්‍රධාන ලක්ෂණ හා වෙනස්කම් පැහැදිලි කරයි. | 1.4.1 ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී යන නාට්‍ය ශෛලීන් දෙකෙහි ප්‍රධාන ලක්ෂණ හා වෙනස්කම් පැහැදිලි කිරීම. | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| • අභ්‍යන්තර හා බාහිර සමාරෝපය යන්නට අර්ථ දක්වයි.<br>• නාට්‍යයක ගැටුම යන්න කුමක් දැ යි නිර්වචනය කරයි.<br>• ලෝකධර්මී හා නාට්‍ය ධර්මී යන ශෛලීන් දෙකෙහි ඇති වෙනස්කම් නාට්‍ය තුළ භාවිතා වන්නේ කෙසේ දැ යි විමසයි. | 1.5 සමාරෝපය<br>1.5.1 අභ්‍යන්තර හා බාහිර සමාරෝපය යන්නට අර්ථ දැක්වීම.<br>උදා: සිඟන්නකු ගේ චරිතය<br><br>1.6 නාට්‍යයේ ගැටුම<br>1.6.1 නාට්‍යයක ගැටුම යන්න කුමක් දැ යි නිර්වචනය කිරීම.<br>උදා: මිනිසා හා මිනිසා අතර, මිනිසා හා පරිසරය අතර මිනිසා සහ මිනිසා ගේ මනස අතර<br>1.7 රඟපෑම හෙවත් රූපණය<br>1.7.1 ලෝක ධර්මී හා නාට්‍ය ධර්මී ශෛලීන් දෙකෙහි ඇති වෙනස්කම් නාට්‍ය තුළ භාවිත වන්නේ කෙසේ දැ යි විශ්ලේෂණය කිරීම. | |
| 02. පරිසරය ආශ්‍රිත අත්දැකීම්, අමුද්‍රව්‍ය හා ස්වකීය පරිකල්පනය සමග මනා ලෙස සංකලනය කරමින් නිර්මාණාත්මක හැකියාව ප්‍රදර්ශනය කරයි.<br><br>• ස්වාභාවික චලන, නිර්මිත චලන,හා තාලානුකූල චලනවල ප්‍රායෝගික ව යෙදෙයි.<br>• ශාරීරික හා මානසික ඒකාග්‍රතාව සඳහා ස්වාභාවික චලන විවිධ තාල හා රිද්මයන්ට අනුකූල ලෙස අභ්‍යාසවල යෙදෙයි. (එම චලනවලට භාවාත්මක හා වාචික ප්‍රකාශන ඇතුළත් කිරීම.) | 2. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්<br>2.1 චලන ක්‍රියාකාරකම්<br>• ස්වභාවික චලන, නිර්මිත චලන හා තාලානුකූල චලනවල ප්‍රායෝගික ව යෙදීම.<br><br>• ස්වාභාවික චලන<br>• නිර්මිත චලන<br>• තාලානුකූල චලන<br>2.1.1 ශාරීරික හා මානසික ඒකාග්‍රතාව සඳහා ස්වාභාවික චලන විවිධ තාල හා රිද්මයන්ට අනුකූල ලෙස අභ්‍යාසවල යෙදීම. (එම චලනවලට භාවාත්මක හා වාචික ප්‍රකාශන ඇතුළත් කිරීම) | 20 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| • ක්ෂණික තීරණ ගැනීම, ක්ෂණික ව ක්‍රියාත්මක වීම අවධානය ලබාගැනීම වැනි ගුණාංග පදනම් කර ගත් රංග ක්‍රීඩාවන්හි යෙදෙයි.<br><br>• චරිතයක්, සිදුවීමක්, අවස්ථාවක් හෝ කිසියම් භාණ්ඩයක් තේමා කරගත් කේවල හා සාමූහික නිරූපණයන්හි යෙදෙයි.<br><br>• පවරණු ලබන ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි.<br><br>• කතා හෝ අත්දැකීම් ඇසුරින් නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි.<br><br>• මිතාන්දරයක් හා නාට්‍යයක් අතර වෙනස දක්වයි.<br><br>• නාට්‍යයෙහි කතාව රංගයක් බවට පත් කිරීමේදී සැළකිය යුතු කරුණු විමසා බලයි. | 2.2 රංග ක්‍රීඩා<br>2.2.1 ක්ෂණික තීරණ ගැනීම, ක්ෂණික ව ක්‍රියාත්මක වීම, අවධානය ලබාගැනීම වැනි ගුණාංග පදනම් කරගත් රංග ක්‍රීඩාවන්හි යෙදීම.<br><br>2.3 ක්ෂණික නිරූපණ හා ප්‍රකාශන<br>2.3.1 චරිතයක්, සිදුවීමක්, අවස්ථාවක් හෝ කිසියම් භාණ්ඩයක් තේමා කරගත් කේවල හා සාමූහික නිරූපණයන්හි යෙදීම.<br>උදා: හිහන්නා - කේවල<br>වෙළෙඳපළ - සාමූහික<br>2.3.2 නියම කරන ලද ක්ෂණික නිරූපණ<br>♦ ගුරුවරයා විසින් නම් කරනු ලබන ක්ෂණික නිරූපණ - යන්හි යෙදීම.<br><br>2.3.3 නාට්‍යමය අවස්ථා නිර්මාණය<br>2.4.1 ප්‍රබන්ධ කතා හෝ අත්දැකීම් ඇසුරින් නාට්‍යමය අවස්ථා නිර්මාණය කිරීම.<br>2.4.2 කතන්දරයක් හා නාට්‍යයක් අතර වෙනස හඳුනාගැනීම.<br>2.4.3 නාට්‍යයෙහි කතාව රංගයක් බවට පත්කිරීමේ දී සැලැකිලිමත් විය යුතු කරුණු පැහැදිළි කිරීම. | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| • මුල, මැද, අග සහිත කතා වස්තුවකින් යුත් නාට්‍ය පෙළක් රචනා කර උචිත රංග ශිල්ප භාවිත කරමින් එකී පෙළ රංගයක් බවට පත් කරයි. | 2.5 නිර්මාණාත්මක පෙළ රචනය<br>2.5.1 මුල, මැද, අග සහිත කතා වස්තුවකින් යුත් රංගෝචිත නාට්‍ය පෙළක් රචනා කිරීම.<br>2.5.2 එකී පෙළ රංගයක් බවට පත්කිරීම. | |
| 03. නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.<br><br>• ශ්වසන, සංවේදන, කටහඬ, ශිථිලීකරණ (සිරුර සැහැල්ලු කිරීමේ) හා චිත්ත ඒකාග්‍රතාව ඇති කර ගැනීමේ අභ්‍යාසයන්හි යෙදෙයි.<br><br>• නිර්දිෂ්ට නාට්‍ය පෙළ කියවා නාට්‍යෝචිත පරිදි සංවාද භාවිත කරයි.<br><br>• නිර්දිෂ්ට පෙළ ඇසුරින් චරිත නිරූපණයේ යෙදෙයි.<br><br>• විවිධ භූමිකාවන්ට ගැළපෙන අංග රචනය කිරීම හා රංග භාණ්ඩ නිර්මාණය කරයි. | 3 . ප්‍රායෝගික ක්‍රියාකාරකම්<br><br>3.1 රංග අභ්‍යාස (ශාරීරික හා මානසික)<br>♦ ශ්වසන, සංවේදන, කටහඬ, ශිථිලීකරණ (සිරුර සැහැල්ලු කිරීමේ) හා චිත්ත ඒකාග්‍රතාව ඇත ිකර ගැනීමේ අභ්‍යාසවල යෙදීම.<br>උදා:<br>▪ ආශ්වාස ප්‍රශ්වාස කිරීමේ අභ්‍යාස (ශ්වසන)<br>▪ පංචේන්ද්‍රියට ගෝචර වන අභ්‍යාස (සංවේදන)<br>▪ හිමකන්ද දියවීම, ඉටිපන්දම උණුවීම (ශිථිලීකරණ)<br>▪ සිසුන්ට දැස් පියාගන්නට සලස්වා උදැසන පිබිදීමේ සිට ඒ මොහොත දක්වා සිදුවීම් සියල්ල ස්මරණය කිරීම (චිත්ත ඒකාග්‍රතාව)<br>▪ කටහඬ අභ්‍යාස පුහුණුව (කටහඬ) | 18 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | | |
|---|---|---|---|
| | 3.2 නාට්‍ය පෙළ කියැවීම<br>♦ නිර්දිෂ්ට නාට්‍ය පෙළ කියවා නාට්‍යෝචිත පරිදි සංවාද භාවිතා කිරීම.<br>3.2.1 නිර්දිෂ්ට පෙළ කියැවීම - නරිබැණා (දයානන්ද ගුණවර්ධන)<br>3.2.2 නාට්‍යෝචිත පරිදි සංවාද භාවිතා කිරීම.<br>3.3 චරිත නිරූපණය<br>3.3.1 නිර්දිෂ්ට පෙළ ඇසුරින් චරිත නිරූපණයේ යෙදීම.<br>3.4 අංග රචනය හා රංග භාණ්ඩ සැලැසුම් කිරීම<br>3.4.1 විවිධ භූමිකාවන්ට ගැළපෙන අංග රචනය කිරීම හා රංග භාණ්ඩ නිර්මාණය කිරීම.<br>3.5 උචිත රංග ශිල්ප භාවිත කරමින් උක්ත පෙළ රංගයක් බවට පත් කිරීම. | |
| 04. නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ දේශීය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිළි කරයි.<br>• දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍ය අංකුරමය අවස්ථා අධ්‍යයනය කර එහි ඇති ප්‍රාසංගික ලක්ෂණ හඳුනාගනියි. | 4. දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍ය අංකුරමය අවස්ථා අධ්‍යයනය කර එහි ඇති ප්‍රාසංගික ලක්ෂණ හඳුනා ගැනීම.<br>4.1දේශීය ශාන්තිකර්මයන්හි සහ ජනනාට්‍ය සම්ප්‍රදායන්හි එන ප්‍රාසංගික ලක්ෂණ අධ්‍යයනය කිරීම. | 12 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| | 4.1.1 සන්නියකුම, රටයකුම, සූනියම් යාගය, කොහොඹා කංකාරිය, ගම්මඩු, දෙවොල්මඩු, පහන් මඩු | |
| 4.2 දේශීය ශාන්තිකර්මයන්හි සහ ජන නාට්‍ය සම්ප්‍රදායන්හි එන ප්‍රාසංගික ලක්ෂණ දක්වයි. | 4.2 දේශිය ජන නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍ය අංකුරමය අවස්ථා අධ්‍යයනය කර එහි ඇති ප්‍රාසංගික ලක්ෂණ හඳුනා ගැනීම.<br>4.2.1 සොකරි, කෝළම් | |
| 05. නාට්‍යමය සංසිද්ධින් සෞන්දර්යාත්මක ව විඳගැනීම හා මානව හිතවාදියකු ලෙස සමාජගතවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි. | 5. රසාස්වාදය හා විචාරය | 20 |
| • සාමූහික රසවින්දනය, අදහස් ප්‍රකාශනය, අන්‍ය අදහස් පිළිගැනීම ආදිය සඳහා නිර්දිෂ්ට නාට්‍ය පෙළ හා නරඹන ලද නාට්‍ය භාවිතා කරයි. | 5.1 සාමූහික රසවින්දනය, අදහස් ප්‍රකාශනය, අන්‍ය අදහස් පිළිගැනීම ආදිය සඳහා නිර්දිෂ්ට නාට්‍ය පෙළ හා නරඹන ලද නාට්‍ය භාවිත කිරීම.<br>5.1.1 නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරින් නරිබෑණා (දයානන්ද ගුණවර්ධන) | |
| • සංවාද, චරිත, ගැටුම, අවස්ථා ගොඩනැගීම කතා වස්තුව, රංග විධාන හා අපූර්වත්වය පිළිබඳ අවධානය යොමු කරමින් නාට්‍ය රස විඳියි. | 5.2 සංවාද, චරිත, ගැටුම, අවස්ථා ගොඩනැගීම, නාට්‍ය වස්තුව, රංග විධාන හා අපූර්වත්වය පිළිබඳ අවධානය යොමු කරමින් නාට්‍ය රස විඳීම. | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

| | | |
|---|---|---|
| • රංග ශෛලීය චරිත නිරූපණය (සතර අභිනය භාවිතය) රංගනය, අවස්ථා නිරූපණය හා රංග ශිල්ප භාවිත කරයි.<br><br>• නාට්‍ය නිර්මාණයේ සමස්ත සාර්ථකත්වය පිළිබඳ විචාරයේ යෙදෙයි. | 5.2 රංගනය<br>♦ රංග ශෛලිය, චරිත නිරූපණය (සතර අභිනය භාවිතය) රංගනය, අවස්ථා නිරූපණය හා රංග ශිල්ප භාවිතය හා ආනුෂංගික අංග පිළිබඳ අවධානය යොමු කිරීම.<br>5.2.1 විවිධ සංගීත ඛණ්ඩවලට සවන් දෙමින් නාට්‍යානුරූපීව අදහස් ප්‍රකාශ කිරීම.<br><br>5.3 නාට්‍ය නිර්මාණයේ සමස්ත සාර්ථකත්වය<br>• නාට්‍ය නිර්මාණයේ සමස්ත සාර්ථකත්වය විශ්ලේෂණය කිරීම. | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## නාට්‍ය හා රංග කලාව

## 6/10 ශ්‍රේණි සඳහා - විෂය නිර්දේශ කමිටුව

මෙහෙයවීම :

මහාචාර්ය ජේ.ඩබ්.වික්‍රමසිංහ මහතා - අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය.

අධීක්ෂණය :

විමල් සියඹලාගොඩ මහතා - සහකාර අධ්‍යක්ෂ ජනරාල් , ජාතික අධ්‍යාපන ආයතනය.

උපදෙස් :-

සුදත් සමරසිංහ මහතා - අධ්‍යක්ෂ, සෞන්දර්ය දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය

විෂය නිර්දේශ විශේෂඥ උපදෙස් :

මහාචාර්ය වෝල්ටර් මාරසිංහ මහතා - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

මහාචාර්ය කේ.සිවතම්බි මහතා - යාපනය විශ්ව විද්‍යාලය

මහාචාර්ය රෝලන්ඩ් අබේපාල මහතා - කොළඹ විශ්ව විද්‍යාලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මංගලිකා ජයතුංග මහත්මිය - කැළණිය විශ්ව විද්‍යාලය

විජේරත්න පතිරාජ මහතා - ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි (විශ්‍රාමික), ජාතික අධ්‍යාපන ආයතනය.

විෂය නිර්දේශ සැකසුම් කමිටුව :

ඩී.එම්.පත්මා කුමාරි මිය - ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි (නාට්‍ය), ජාතික අධ්‍යාපන ආයතනය.

කේ.ජී.අජිත් රූපසේන මහතා - ව්‍යාපෘති නිලධාරි (නාට්‍ය) ජාතික අධ්‍යාපන ආයතනය.

අනෝමා කුමාර සමරක්කොඩි මිය - ගුරු උපදේශක (වයඹ පලාත)

ක්ලයිව් ශාන්ත මහතා - ගුරු සේවය , ශාන්ත ආනා විද්‍යාලය, කුරුණෑගල.

පාලිත ලොකුපෝතාගම මහතා - ගුරු සේවය, වික්‍රමශිලා ම.ම.වි., ගිරිඋල්ල.

ලලිතා ජයරත්න මිය - ගුරු සේවය, මාදම්පේ විජය මහා විද්‍යාලය, අටකලම්පන්න,

පී.ඩී.ස්වර්ණලතා මිය - ගුරු සේවය, පෝද්දිවෙල මහා විද්‍යාලය, ඇල්පිටිය.

ජී.කරුණාවතී මිය - ගුරු සේවය, එම්.ඩී.එච්.ජයවර්ධන මහා විද්‍යාලය, බත්තරමුල්ල.

ව්‍යාපෘති කණ්ඩායම් නායක :

කේ.ජී.අජිත් රූපසේන මහතා - ව්‍යාපෘති නිලධාරි (නාට්‍ය) ජාතික අධ්‍යාපන ආයතනය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.